# RITHU Akarsha

# සමහර වෙබ් සයිට් ගැන කළකිරෙනවා.........



## මොකද්ද රිතු මේ සිද්ධිය?

මම කියපු එක්තරා කතාවක් හරිම නරක විදියට විකෘති කරලා දාල තිබුනා.

## මොකද්ද ඔයා කියපු කතාව?

මම උත්සවයකට යනකොට මා අතින් මාර්ග නීතියක් කඩකෙරුනා, ඒත් ඒක බොහොම සුහදව පොලීසියත් එක්ක මම විසදගත්තා. ඒ ගැන පහුගිය කාලේ මං ගැන පළවුන ආටිකල් වල වගේම රූපවාහිනී වැඩසටහන්වලත් ගියා. ඒත් ඒ ඇත්ත ගැන කතා නොකර, මාව වෙනත් නරක චෝදනාවකට ලක් වෙලා පොලිස් අත්අඩංගුවට ගත්තා කියලා සදහන් වෙලා තිබුනා.

## ඉතින් මේ ගැන අදාළ වෙබ් අඩවිය දැනුවත් කළේ නැද්ද?

ඒකේ තියෙන එයාලගේ ඊමේල් එකට මම මැසේජ් එකක් දැම්මා ඒක නිවැරදි කරන්න කියලා. ඒත් කිසිම පිළිතුරක් නැහැ. ඇත්තටම පුදුම කළකිරීමක් දැනුනා. මේ වගේ බොරු ප්‍රවෘත්ති දාලා එයාලා මොනවද බලාපොරොත්තු වෙන්නේ.....

## නිවසේ අය මොනවද කියන්නේ?

ගෙදර අය වගේම මගේ ලගම හිතවතුන් මඩ ගැන දන්නවා. ඒත් අම්මාගේ හිත රිදිලා ගොඩාක්, පව්. මේ වගේ කිසිම පදනමක් නැති දෙයක් මට වුන එක ගැන එයාට දුකයි.



## මේ ගැන නීතිමය ක්‍රියාමාර්ගයක් ගන්නේ නැද්ද?

CID එකට මේ තොරතුරු මම භාර දුන්නා. බලමු ඉතින් නේද? ඇත්තටම කිසිම අනන්‍යතාවක්, ප්‍රමිතියක් නැති වෙබ් අඩෙවි ගැන රජයේ අවධානය යොමු වෙන්න ඕන කියන එකයි මගේ හැගීම.

## මෙහෙම දේවල් වෙනකොට නිළියක් වීම ගැන පසුතැවෙනවද?

එහෙම නොහිතුනා කිව්වොත් ඒක බොරුවක්. ඒත් අද අන්තර්ජාලයෙන් නිළියන්ට විතරක් නෙවෙයි සාමාන්‍ය යුවතියන්ටත් මඩ ගහනවා. එහෙම කරන අයට හිතන්න හිතක් තියෙනවානම්, තමන්ටත් අම්මා කෙනෙක් ඉන්නවා කියලා. ඒ වගේම මං විශ්වාස කරන දේ තමයි, තමන්ගේ මව ගැන ගෞරවයක් නැති කෙනා තමයි තවත් ගැහැනියකගේ ගෞරවය විනාශ කරන්න අපහාස කරන්නේ කියලා.

බුද්ධිනී ජයවර්ධන



# රිතික්ගේ බිරිද ඔහුගේ සමීප මිතුරෙකු විවාහ කරගන්න සූදානමක්

රිතික් හා සුසෑන්ගේ දික්කසාදය ගැන බොහෝ කටකතා පැතිරුණා. රිතික්ගේ නම කන්ගනා සමගත් සුසෑන්ගේ නම අර්ජුන් රාම්පාල් සමගත් සම්බන්ධ කරමින් කතා පැතිරුණා.

අලුත්ම ලැබුන ආරංචිය සුසෑන් රිතික්ගේ සමීප මිතුරෙක් විවාහ කරගන්න යන බවයි. ඒත් ඒ මිතුරා කවුද කියා තවමත් හෙළි වී නැහැ.